SMART VISUAL ENTERPRISES®
Research and development (Electronic)
No. 146, Millaniya Estate, 3rd Step, Paragasthota.
Tel : 0722 273877 /web : www.smartvisual.lk/ E-mail: ssmartvisual@gmail.com

# විදුලි / විද්‍යුත් භාණ්ඩ ආරක්ෂණය

ඔබගේ වටිනා විදුලි හා විද්‍යුත් භාණ්ඩ විශේෂ ආරක්ෂක පරිපථ වලින් ආරක්ෂා කර ගත යුතු වන්නේ විදුලිබල සැපයුමෙහි නියමිත වෝල්ටීයතාවය අවම හා උපරිම ප්‍රමාණයන් වෙනස්වීම හා විදුලි සැපයුම හදිසියේ විසන්ධි වීමෙන් ක්ෂණිකව නැවත නැවත සම්බන්ධවීම, වැසි දිනවල දී සිදුවන විදුලි කෙටීම හා අකුණු සැර නිසාද අනාරක්ෂිත වන බැවිනි. එසේම මෙම ස්වාභාවික අනතුරු සඳහා විදුලි/ විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදකයා වග කියනු නොලබයි. එවැනි අවස්ථාවල දී කාලය මහන්සිය ද ශ්‍රමය ද ධනය ද අමතරව වැය කළ යුතු අතර කණගාටුවට හේතුවන කරුණ වන්නේ දැනට නිපදවන සියළු විදුලි හා විද්‍යුත් උපකරණ තුළ ආරක්ෂක පරිපථ නොමැතිව නිපදවීම හා ගුණාත්මක භාවය ද ඉතාමත් මඳ බැවින් පාරිභෝගික ඔබ තවත් අසරණ වීමයි.

## නිෂ්පාදිත අත්දැකීම්

මෙම භාණ්ඩ නිෂ්පාදනය කරනුයේ ඉලෙක්ට්‍රොනික් ක්ෂේත්‍රයේ වසර 20 කට නොඅඩු කාලයක් රැඳී සිටින හා ආරක්ෂිත විදුලි පරිපථ නිර්මාණයේ අද්විතීය සොයා ගැනීම් සඳහා පේටන්ට් බලපත්‍ර සහිතව ද නව නිපැයුම් හිමියන්ගේ කොමිසම මගින් පවත්වන ලද ජනාධිපති සම්මාන තරගයේ දී ඉංජිනේරු අංශයෙන් ස්වර්ණ සම්මානයෙන් ද (Presidential award Best Winning - 2011) කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් පවත්වන ලද SMIDEX National Award - 2014 (නව නිපැයුම් අංශය) හා පර්යේෂන හා තාක්ෂණ අමාත්‍යංශයේ Sahasak National Award - 2014, Sri Lankan Entrepreneur of the Year 2017 හා World Invention & Technology Expo (Wintex) 2018 ජාත්‍යන්තර ස්වර්ණ සම්මානයෙන් දිරිගැන් වූ ආයතනයක දේශීය නව නිපැයුමකි.

## වගකීම්

මෙම භාණ්ඩ ඔබ විසින් මැදිහත් වීමක් නොකර තිබෙනතාක් කල් එහි ක්‍රියාකාරීත්වය අවුරුද්දක කාලයක් සඳහා සහතික කෙරේ. ප්‍රබල අකුණු වලින් වන හානි සඳහා වගකීමක් දිය නොහැක. ස්වභාවධර්මයෙන් සිදුවන අකුණු ගැසීම්, ජල ගැලීම් වලින් වන හානි වැලැක්වීමට ජගතෙකු හෝ උපකරණයක් හෝ නොමැත. මෙම පරිපථ වලින් කළ හැක්කේ අකුණු සැර කෙලින්ම ඔබගේ විදුලි උපකරණ වෙතට යෑමෙන් සිදුවන හානි වලක්වා ගැනීමයි.

## පාරිභෝගිකයාට ලැබෙන වාසි

අපගේම තාක්ෂණයෙන් දේශීය නිෂ්පාදනය කර ඇති මෙම පරිපථයක් ඔබ නිවසේ ඇති විදුලි/ විද්‍යුත් උපකරණයකට සම්බන්ධ කළ පසු ඔබ නිවසින් බැහැරව ගොස් සිටියත්, නිවසේ නිදා සිටියත් එම උපකරණවල ආරක්ෂාව තහවුරු කෙරේ. එමගින් ඔබේ සිතට ඉමහත් සහනයක් ලබාදෙනු ඇත. මේ සඳහා වගකීමේ සහතිකයක් දෙනු ලැබේ. ඉන්පසු වුවද අපගේ සුහදශීලි සේවය අවශ්‍ය නම් ලබාගත හැක.

## Fridge Guard
කාල පමාව මි. 3-5




Pin Type

Model No.: SVE1215



Wire Type

Model No.: SVE1836W

***TV Guard**, Home Theater, Computer*
**ආදී සියළු විද්‍යුත් උපකරණ සඳහා**
කාල පමාව තත්පර 10-15




Pin Type

Model No.: SVE1314



Wire Type

Model No.: SVE1845W

01. **OK LED දර්ශකය**
වෝල්ටීයතාවය 180V - 260V අතර නම් කොළපාට LED දර්ශකය නිවි නිවී දැල්වේ. සඳහන් කර ඇති කාල පමා කාලයේ දී විදුලිය ස්වයංක්‍රියව සැපයෙනවාත් සමගම කොළ පැහැති LED දර්ශකය දිගටම දැල්වේ.

02. **Low LED දර්ශකය**
කහ පහැති LEDදර්ශකය (Low) නොකඩවා දැල්වේ නම් විදුලි සැපයුමේ අඩු වෝල්ටීයතාවය දර්ශනය වේ. (170Vට අඩු) නියමිත වෝල්ටීයතාවය සමනය වන තුරු කහ පැහැති LED දර්ශකය දිගටම දැල්වේ. එවිට ස්වයංක්‍රීයව පරිපථයෙන් විදුලිය විසන්ධි කර කොළ පැහැති LED දර්ශකය ද නිවි නිවි දැල්වේ.

03. **High LED දර්ශකය**
රතු LED දර්ශකය (High) නොකඩවා දැල්වේ නම් විදුලි සැපයුමේ වැඩි වෝල්ටීයතාවය දර්ශනය වේ. (260Vට වැඩි) නියමිත වෝල්ටීයතාවය සමනය වන තුරු රතු පැහැති LED දර්ශකය දිගටම දැල්වේ. එවිට ස්වයංක්‍රියව පරිපතයෙන් විදුලිය විසන්ධි කර කොළ පැහැති LED දර්ශකය ද නිවි නිවි දැල්වේ.

04. විදුලි සැපයුම දිගේ එන අකුණු සැර හා අධි විදුලිය කපා හරින නැවත සම්බන්ධ කරගත හැකි පිටතින් සවිකර ඇති ආරක්ෂිත පියුසය මගින් පරිපථයේ ආරක්ෂාව සැලසේ.

**වැදගත්**
සලකුණු කර ඇති ධාරිතාවට වඩා අධික ධාරිතාවක් පරිපථයට දැරිය නොහැකිය. (විශේෂයෙන් සැලකිලිමත් වන්න)

පරිපථයේ ඇති පියුසයේ (fuse) විසන්ධිවීමක දී සඳහන් කර ඇති ධාරිතාවට අදාළ පියුසයම නැවත මාරු කරගත යුතුවේ.

**භාවිතයට උපදෙස් :**
- තෙතමනය සහිත ස්ථානවල නොතබන්න.
- වැසි හා මිහිදුම් සහිත ස්ථානවල නොතබන්න.
- උපකරණය භාවිතා කරන කිසිම අවස්ථාවක වසා නොතබන්න.
- කුඩා ළමයින්ට ළඟාවිය නොහැකි ස්ථානයක තබන්න.

Marketing & Distribution By
**Lexus Marketing Services**
No. 437/A/1, Galle Road, Panadura, Sri Lanka.
Tel : 038 312 1287/ 0761 356 283/ 0761 356 285/ 0761 356 282
E-mail : ssent064@gmail.com